ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා
නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2567 2024 අගෝස්තු 19 නිකිණි කලාපය

**දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති**
**ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරාධිකාරී**
**කොළඹ නාලාන්දා මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය**
**ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය ලේල්වල සමිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# පුද්ගලයෙකු ශ්‍රේෂ්ඨ වන්නේ විජ්ජා - චරණ දෙකිනි.

**"ඛත්තියෝ සෙට්ඨෝ ජනේතස්මිං - යේ ගොත්තප්පටිසාරිනෝ**
**විජ්ජාචරණ සම්පන්නෝ - සෝ සෙට්ඨෝ දේවමානුසේ"**

**(දීඝ නිකාය, අම්බට්ඨ සූත්‍රය)**

සුපින්වතුනි,

'මානය' කියන්නේ පුද්ගලයා අකුසලයට යොමු කරවන බලවත් ක්ලේශයක්. මානය හටගැනීමට ද්වේෂය මුල් වෙනවා. තමා උසස්ය අනෙකා පහත්ය යනුවෙන් සිතීම මානයේ බලවත්ම අවස්ථාවක් බව අප විසින් තේරුම් ගත යුතුයි. පළමුව අනතිමානී වී දෙවනුව නිහතමානී වීමට අප උත්සාහ කළ යුතුය. නිහතමානී වන්නේ රහත් වූ විටය. බුදුරජාණන්වහන්සේ කොසොල් රටේ ඉච්ඡානංගල ගමට නුදුරු වන ලැහැබෙහි වැඩ සිටින කාලෙ උන්වහන්සේගේ ගුණකථාව ඇසූ උක්කට්ඨා නුවර විසූ පොක්ඛරසාදී බමුණා එම ගුණකථාව සත්‍යයක් දැයි දැනගෙන එන ලෙස තම ශිෂ්‍ය අම්බට්ඨ මානවකයාට කිවේය. එය කෙසේ දැන ගත හැකි දැයි අම්බට්ඨ විමසූ විට දෙතිස් මහා පුරුෂ ලක්ෂණ තිබේදැයි පරික්ෂා කිරීමෙන් ඒ බව

බව දැන ගත හැකි යයි ඇදුරා කීය.

බුදුරදුන් වෙත පිරිස සමග ගිය අම්බට්ඨ බුදුරදුන්ට නිගරු වනසේ සක්මන් කරමින්ද, හිටගෙන සිටිමින්ද, කථා කරන විට, ඔබ මේ ලෙස ඔබේ ගුරුවරුන් ඉදිරිපිටදීත් හැසිරෙනවාදැයි බුදුහු විමසූහ. 'භවත් ගෞතමය, බඹහුගේ පතුලෙන් උපන් මුඩුමහණුන් සමග කතා කරන්නේ මේ ආකාරයට' යැයි අම්බට්ඨ කීය.එවිට බුදුහු' ඔබ ඇදුරු කුලයෙහි ලද හික්මීමක් නැති, අල්පශ්‍රැත අයෙකි. මෙසේ හැසිරෙන්නේ ඒ නිසා යයි වදාළහ.

ඉන්කිපුණු අම්බට්ඨ මානවකයා ශාක්‍යන්ට බොහෝ දොස් කිවේය. බුදුරදුන් ඊට හේතු ඇසුවිට පෙර දිනයක ශාක්‍යන්ගෙන් තමාට සිදුවූ මදිපුංචිකමක් ගැන අම්බට්ඨ කීය. ක්ෂත්‍රිය වෛශ්‍ය ශුද්‍ර යන තුන් කුලයම බමුණන්ගේ සේවකයන් බවත්, ඔවුන් බමුණන්ට ගරු සත්කාර කළයුතු බවත් අම්බට්ඨ කිවේය. මොහු ඉතා දැඩි ලෙස ශාක්‍යන්ට අපහාස කරන බැවින් මොහුගේ ගෝත්‍රයේ ආරම්භය පෙන්වා දිය යුතු යයි සිතූ බුදුරජාණන්වහන්සේ 'නුඹ කිනම් ගෝත්‍රයකට අයත් දැයි අම්බට්ඨයගෙන් ඇසූහ. හෙතෙම බොහොම ආඩම්බරයෙන් 'මම කණ්හායන ගෝත්‍රයට අයත් වෙමි' යි උස් හඬින් තෙවරක්ම කිවේය.

එවිට බුදුරජාණන්වහන්සේ 'අම්බට්ඨ ඔබේ පරපුරේ ඉතිහාසය බැලූ විට ශාක්‍යයෝ නුඹගේ ස්වාමිවරුය. නුඹ ශාක්‍යයන්ගේ දාසියකගේ පරපුරකට අයත් කෙනෙකි'යි වදාළහ. එවිට සෙසු මානවකයෝ අම්බට්ඨ ගුණවත් කෙනෙකු බැවින් ඔය ලෙස නින්දා නොකරන්නැයි බුදුරදුන්ට කීවෝය. එවිට බුදුන්වහන්සේ 'නුඹගේ පරපුරේ ආදිපුරුෂයා කවුරුන්ද'යි අම්බට්ඨයගෙන් ඇසූහ. නිහඬව සිටි අම්බට්ඨ බුදුරදුන් විසින් තෙවැනි වරටත් අසන ලදුව 'කණ්හ ඍෂිවරයා තම පරපුරේ මුල් පුරුෂයා බව කීය.

ඒ කණ්හ නමැත්තා ශාක්‍ය වංශයේ මුල් පුරුෂයා වන ඔක්කාක රජුගේ දිසා නමැති දාසියකුගේ පුතෙකු බව බුදුහු වදාළහ. අම්බට්ඨ පරපුරේ මුල් පුරුෂයා දාසයකු බව දැනගත් සෙසු මානවකයෝ ඔහුට නිග්‍රහ කළහ.එවිට බුදුරජාණන්වහන්සේ එසේ නිග්‍රහ නොකළයුතු බවත්, ඒ කණ්හා නමැත්තා දක්ෂිණාපථයට ගොස් මන්ත්‍ර ඉගෙන පැමිණ ඔක්කාක රජු බිය ගන්වා රජුගේ මට්ටරූපී නම් ක්ෂත්‍රිය කුමාරිය සරණපාවා ගත් බවත් ඔහුගෙන් පැවතෙන අය 'කණ්හායන' නමින් හඳුන්වන බවත් වදාරා දාස වාදයෙන් අම්බට්ඨ මුදා ගත්හ.

මේ ඉතිහාසය අනුව ශ්‍රේෂ්ඨ වන්නේ බමුණා නොව ක්ෂත්‍රියයා බව පෙන්වා වදාළ බුදුරජාණන්වහන්සේ ජාති,කුල, ගෝත්‍ර නිසා කෙනෙකු උසස්, පහත් නොවන බවත්, කෙනෙකු උසස් වන්නේ විජ්ජා හා චරණ ධර්ම ඔහු තුළ තිබේනම් පමණක් බවත් පෙන්වා දෙමින් මේ ගාථා වදාළහ.

'ඛත්තියෝ සෙට්ඨෝ ජනේතස්මිං - යේ ගොත්ත පටිසාරිනෝ
විජ්ජා චරණ සම්පන්නෝ - සෝ සෙට්ඨෝ දේවමානුසේ'

“නම් ගොත් අනුව බලන විට ජනයා අතර ශ්‍රේෂ්ඨ වන්නේ ක්ෂත්‍රියාය. විජ්ජා චරණ දෙකින් යුත් තැනැත්තා දෙවියන් හා මනුස්සයන් අතර ශ්‍රේෂ්ඨ වේ.

පුද්ගලයා ශ්‍රේෂ්ඨයකු කරවන ඒ විද්‍යාව, ඒ චරණය තමාගේ ජාතිය, ගෝත්‍රය අනෙක් ජාති ගෝත්‍රවලට වඩා ශ්‍රේෂ්ඨ යැයි සිතන අය ළඟ නැති බවත්, එම ජාතිවාදී ගෝත්‍රවාදී හැඟීම් ඉවත් කළ පසු විජ්ජා හා චරණ සම්පත්ති ප්‍රත්‍යක්ෂ කළහැකි බවත් බුදුහු පෙන්වා දුන්හ.

“ගෞතමයනි, ඒ විද්‍යාව ඒ චරණය කුමක්දැයි අම්බට්ඨ විමසීය.

“අම්බට්ඨය, අරහත් වූ, විජ්ජා චරණ දෙකින් සම්පූර්ණ වූ, යහපත් වචන ඇති, අනුත්තර පුරිසදම්ම සාරථීවූ තථාගතයන් ලොව පහළ වී මුල, මැද, අග යහපත්වූ, අර්ථ ව්‍යඤ්ජන සහිත වූ ධර්මය දේශනා කරනවා. ඒ දහම් අසන යම් පුද්ගලයෙක් තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගෙන, ගිහිගෙයි සිටිමින් එම දහම් මග යා නොහැකියි සිතා පැවිදි වී ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුතුව, කුඩා වූ ද වරදෙහි බිය දකිමින්, සිකපද හොඳින් රකිමින්, තිදොරින් කුසල් දහම්හි යෙදෙමින්, සංවර වූ ඇස, කන ආදී ඉඳුරන් ඇතිව, සිව්පසෙහි ලද පමණින් සතුටු වෙමින්, ආර්ය වූ ශීලයෙන්, ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන්, ආර්ය වූ සිහිය සිවු ඉරියව්වෙහිම පවත්වා ගනිමින්, භාවනාවට පිවිස පංච නීවරණ දුරු කිරීමට උත්සාහ කරනවා.

මෙසේ උත්සාහ කරන ඔහුට, ණයෙන් මිදුනා සේ කාමච්ඡන්දයෙන් මිදුණු බව පෙනෙනවා. ලෙඩක් වැළඳී සිට සුවපත් වූවාසේ, ව්‍යාපාදයෙන් මිදුණු බව පෙනෙනවා. සිර ගෙදරින් මිදුණා සේ ථීන මිද්ධයෙන් මිදුණු බව පෙනෙනවා. කෙනෙකුට දාසකම් කරමින් සිට එයින් මිදුනාසේ උද්ධච්ච කුක්කුච්චයෙන් මිදුණු බව පෙනෙනවා. මෙතෙක් යමින් සිටි කාන්තාර මාර්ගය අවසන් වූවා සේ විචිකිච්ඡාවෙන් මිදීම පෙනෙනවා.

මෙසේ භාවනා කරන ඔහුගේ සිත පංච නීවරණයන්ගෙන් මිදුණු බව දකින විට ඔහුට සිතේ සතුට ඇතිවූ විට, එය ශරීරය පුරා පැතිර යන්නාසේ ප්‍රීතිය ඇතිවෙනවා. ප්‍රීතිය ඇතිවුනාම ඔහුගේ නාම කය (චිත්ත, චෛතසික) සංසිඳුණු බව පෙනෙනවා. නාම කය සංසිඳුණු විට ලොකු සුවයක්, සනීපයක් දැනෙනවා. එවිට සිත එකඟ වෙනවා. සිත අරමුණට එකඟ කරගෙන භාවනා කරන ඔහුට විතක්ක විචාර, පීති, සුඛ, එකග්ගතා යන මේ කරුණු පහ සම්පූර්ණ වීම නිසා ප්‍රථම ධ්‍යාන කුසල සිත ඇතිවෙනවා. මෙය ඔහුගේ චරණ ධර්මයකි. ඉන්පසු තවදුරටත් සිත පුරුදු කිරීමෙන් දෙවන තුන්වන හා සතරවන ධ්‍යාන ලබනවා මේවාද ඔහුගේ චරණ ධර්මයන්ය.

මෙසේ ධ්‍යාන ලබන සිත පිරිසිදු වුණාම, ප්‍රභාශ්වර වුණාම, රළු කෙලෙස් දුරු වුණාම, විදර්ශනාවට සුදුසු වුණාම ඉද්ධි විධ, දිබ්බසෝත, පරිච්චිත්ත විජානන, පුබ්බේනිවාසානුස්සති, චුතූපපාත, ආසවක්ඛය යන අභිඥාභය ලබා ගන්නවා. මෙය ඔහුගේ විද්‍යාවයි.

සිත සංවර වීම, ධ්‍යාන ලැබීම, පිරිසිදු සීලය වැනිදේ මෙම උසස් ඥානයන් ලබා ගැනීමට උපකාර වෙනවා. ඒ නිසා ඒවාට චරණ ධර්ම කියා කියනවා. පාද හා පියාපත් වලට චරණ කියනවා. විද්‍යාව මුඛය හෙවත් හොටය වගෙයි. විමුක්ති රසය විඳීමට නම්, චරණ ධර්ම නමැති පිහාටු හෝ පාද උපකාරයෙන්, විමුක්තිය නමැති ඵලය වෙත ගොස් විද්‍යා නමැති හොටයෙන් හෙවත් තුඩින් ඒ විමුක්ති ඵල රසය විඳිය යුතුයි. සීලය, ඉන්ද්‍රිය සංවරය, ආහාරයෙහි පමණ දැනීම, නිදිවරමින් භාවනාවෙහි යෙදීම, ශ්‍රද්ධාව, ලැජ්ජාව, බය, බහුශ්‍රැත බව, ආරම්භ කරන ලද වීර්යය, එළඹ සිටි සිහිය, ප්‍රඥාවෙන් යුක්ත වීම,සහ ධ්‍යාන හතර වශයෙන් චර්ම ධර්ම පහළොවක් තියෙනවා

.

විදර්ශනා ඥානය, මනෝමය ඉර්ධි ඥානය, ඉර්ධිවිධ ඥානය, දිබ්බසෝත ඥානය, චේතෝපරිය ඥානය, පුබ්බේනිවාසානුස්සති ඥානය, පරිචිත්ත විජානන ඥානය, ආසවක්ඛය ඥානය, යනුවෙන් විද්‍යා අටක් තියෙනවා.

අම්බට්ඨ මේවාට වඩා උසස් චරණයක් හෝ විද්‍යාවක් නැත. ඔබ මීට පෙර මෙම අනුත්තර විජ්ජා චරණ සම්පත්තියක් ගැන අසා තිබෙනවාද? ඔබ හෝ ඇදුරා හෝ මේවා ලබා තිබේද? නැත ගෞතමයනි, මේවා ලැබීමට ඔබ හෝ ඇදුරා හෝ උත්සාහ කර තිබෙනවාද? නැත ගෞතමයනි, අම්බට්ඨය, තොපත්, තොපගේ ඇදුරාත් මේ විජ්ජාචරණ සම්පත්තියෙන් බැහැරය.

ඉක්බිති බුදුරජාණන්වහන්සේ ගඳකිලියෙන් නික්ම සක්මන් මළුවට ගියහ. අම්බට්ඨ බුදුන් පසුපස යමින් බුදුරදුන්ගේ ශරීරයෙහි දෙතිස් මහා පුරුෂ ලක්ෂණ තිබේදැයි පරික්ෂා කළේය. පහුත ජිව්හතා, කෝසෝහිත වත්ථගුය්හ යන ලක්ෂණ දෙක බුදුහු ඍද්ධියෙන් පෙන්වා අම්බට්ඨගේ සැකය දුරු කළහ.

ඒ නිසා පින්වත්නි, ඔබට නිවන් දැකීමට අවශ්‍ය නම් පළමුව සීලයෙන් ගමන අරඹන්න. සීලයෙහි නතර නොවී ඉන්ද්‍රිය සංවරය නම් වූ දෙවැනි පියවරට යන්න. බත් මත ඇති නොවන පරිදි පමණට අහාර ගෙන, නිදි වරාගෙන භාවනා කරන්න. තෙරුවන් ගැන අප්‍රමාණ ශ්‍රද්ධාව ඇතිකර ගන්න, පව් කිරීමට ලජ්ජා බය ඇතිකර ගන්න, ධර්මය හොඳින් ඉගෙන ගෙන චතුරංග සමන්නාගත වීර්යයෙන්, සතර ඉරියව්වෙහි සිහිය පිහිටුවමින් ධ්‍යාන ලබා එය විදර්ශනාවට හරවා ගෙන අෂ්ට විද්‍යා වන් ලබන්න මේ ඔබට නිවන් දැකිය හැකි මගයි

**සැමට තෙරුවන් සරණයි!**